රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 41/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 නොවැම්බර් මස 25 වැනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත,

## අනියම් සහ තාවකාලික සේවකයින්

පහත සඳහන් 1988.08.31 දින අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දෙමින් ජනාධිපති ලේකම්, අගමැති ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් ඇමතූ අමාත්‍ය මණ්ඩල ලේකම් වරයාගේ අංක. අමප/1988 විවිධ (365) දරණ 1988.09.07 දිනැති ලිපියට අවධානය යොමු කරනු ලැබේ.

" 1988 අගෝස්තු 31 දින වනවිට රාජ්‍ය සේවයේ 06 මසක සේවාකාලයක් සහිත සියලු අනියම් සහ තාවකාලික සේවකයන් ස්ථිර කළයුතු බැව් තීරණය කරන ලදී. පළාත් පාලන අංශය සහ සංස්ථා අංශය සඳහාද එම ප්‍රතිපත්තියම අදාළ විය යුතුය."

02. පහත සඳහන් 1988.10.19 දින අමාත්‍ය මණ්ඩල තීරණය දැනුම් දෙමින් ජනාධිපති ලේකම්, අගමැති ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පිටපත් සහිතව මා ඇමතූ අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ අංක. අමප/1988 විවිධ (434) දරණ 1988.10.26 දිනැති ලිපියටද අවධානය යොමු කරනු ලැබේ.

" 1988.08.31 දින අමාත්‍ය මණ්ඩලය කලින් එළඹි තීරණය ප්‍රකාර අනියම් සේවකයින්ට ස්ථිර තත්වය ප්‍රදානය කිරීමේදී, ඔවුන් විසින් සේවය කළයුතු පරිවාස කාලය නියම කිරීම ඔවුන්ගේ අනියම් සේවා කාලයට වාසි සැලසෙන පරිදි කළයුතු යයි තීරණය කරන ලදී. නිදසුනක් වශයෙන් තුන් වසරක අනියම් සේවයක් ඇති අනියම් සේවකයෙකු පරිවාස කාලයකට යටත් කිරීම අවශ්‍ය නොවේ."

03. 1988.11.23 දිනැති පහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයද පිළිපැදීමට කරුණාකර සටහන් කර ගන්න.

" හය මාසයකට වඩා වැඩි සේවයක් ඇති අනියම් සේවකයින් ස්ථිර කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය කඩිනමින් ක්‍රියාත්මක කොට, අප්‍රමාදව එකී සේවකයින් අදාළ වැටුප් පරිමාණ මත තැබිය යුතු යයි තීරණය කරන ලදී. රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා මේ සම්බන්ධව උපදෙස් නිකුත් කළයුතු යයිද තවදුරටත් තීරණය විය."

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.